[illegible] සහ විමර්ශන අංශය
මැතිවරණ කොමිෂන් සභා[illegible]
2[illegible] 202[illegible]

# පක්ෂ ව්‍යවස්ථාව

## පෙරටුගාමී සමාජවාදී පක්ෂය

පෙරටුගාමී සමාජවාදී පක්ෂය
முன்னிலை சோஷலிசக் கட்சி
FRONTLINE SOCIALIST PARTY

## පළමු අධිකාරිය

### පක්ෂයේ අභිප්‍රාය

පෙරටුගාමී සමාජවාදී පක්ෂය වූ කලී ලාංකීය නිර්ධන පංතියේ පක්ෂයයි. එය මාක්ස් ඒංගල්ස් හා ලෙනින් ගේ දර්ශනය වන විද්‍යාත්මක මාක්ස්-ලෙනින්වාදය මත පදනම් වෙයි.

කම්කරු ගොවි පීඩිත පන්තීන්ගේ ( නිර්ධන පන්තියේ )දේශපාලන සංවිධානය බවට පත්වීම, නිර්ධන පංතිය අතට රාජ්‍ය බලය දිනා ගැනීම හා නිර්ධන පංතියේ අභිලාශය වන පන්ති රහිත සූරාකෑම රහිත සියලු ජනතාවන් සමානාත්මතාවයේ අයිතිවාසිකම් භුක්ති විඳින, සමාජ ආර්ථික දේශපාලන වටපිටාවක් නිර්මාණය කිරීම පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ අභිප්‍රායයි

## දෙවෙනි අධිකාරිය

### පක්ෂ සංඥා

**1. වන වගන්තිය**

පක්ෂයේ නාමය - පක්ෂයේ නාමය පෙරටුගාමී සමාජවාදී පක්ෂය විය යුත්තේය. එය ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රොන්ට් ලයින් සෝෂලිස්ට් පාටි විය යුත්තේය. පක්ෂයේ නාමයේ කෙටි යෙදුම FLSP ලෙස හෝ පෙසප විය යුත්තේය.

**2. වන වගන්තිය**

පක්ෂයේ ලාංඡනය - පක්ෂයේ මැතිවරණ ලාංඡනය කුලුගෙඩිය හෝ මධ්‍යම කමිටුව විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු සළකුණක් විය යුත්තේය.

## තුන්වන අධිකාරිය

### සාමාජිකත්වය

**3. වන වගන්තිය**

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ සාමාජිකත්වය සඳහා යෝජනා කිරීමට හෝ මධ්‍යම කාරක සභාවෙන් සාමාජිකත්වය ඉල්ලා සිටීමට හෝ ලංකාව තුළ නිත්‍ය වශයෙන් පදිංචිව ඇති, අධ්‍යාපන රැකියා වැනි හේතූන් උඩ හෝ දේශපාලන හේතූන් උඩ රටින් බැහැරව පදිංචි වී සිටින, වයස අවුරුදු 16 සම්පූර්ණ පක්ෂයේ වැඩපිළිවෙල හා ප්‍රතිපත්ති පිළිගනනා අයවලුන් සුදුස්සන් වෙති.

එසේම මධ්‍යම කාරක සභාවේ අභිමතය පරිදි පක්ෂයේ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙලවල් පිළිගන්නා විදෙස් වාමාංශික පක්ෂ ක්‍රියාකාරින්ට ද පක්ෂයේ සාමාජිකත්වය පිරිනැමිය හැකිය.

පෙරටුගාමී සමාජවාදී පක්ෂය
முன்னிலை சோஷலிசக் கட்சி
FRONTLINE SOCIALIST PARTY

## සාමාජිකත්වයේ කොන්දේසි

**4. වන වගන්තිය**

එසේ පක්ෂ සාමාජිකත්වය ඉල්ලා සිටින්නන් සාමාජිකත්වය සඳහා යෝජනා කරන්නන්

1. පක්ෂයේ ප්‍රතිපත්ති, වැඩපිළිවෙල, ක්‍රියාමාර්ග හා ව්‍යවස්ථා මාලාව පිළිපදින්නාවූ ද
2. පක්ෂයේ ඒකකයකට සම්බන්ධ වී ඒ තුළ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස පක්ෂයේ වැඩකටයුතු වලට සහභාගී වන්නාවූ ද
3. පක්ෂයේ තීරණ ක්‍රියාවට නගන්නට හා එහි නියෝග පිළිපැදීමට සූදානම් වූ ද, එහි විනය ගරු කරන්නා වූ ද
4. පක්ෂයේ අරමුණු හා පරමාර්ථ සාධනයෙහිලා අවශ්‍ය හැම දෙයක්ම කිරීමට සූදානම් වූ ද
5. පක්ෂය රැකීමටත් පක්ෂය ගොඩනැගීමටත් ඇපකැපවී යෙදී සිටින්නා වූ ද
6. පක්ෂ ජීවිතයේ දී අවංක හා සත්‍ය ගරුක වන්නා වූ ද
7. කාලානුරූපව මධ්‍යම කාරක සභාව නියම කරන්නාවූ මුදලක් සිය මාසික ආදායමින් පක්ෂයට ගෙවීමට සූදානම් අයවලුන් විය යුතුය.

## සාමාජිකයකු සතු අයිතිවාසිකම්

**5. වන වගන්තිය**

1. පක්ෂයේ ප්‍රතිපත්ති වැඩපිළිවෙලවල්, ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරීත්වය පිළිබඳව පක්ෂ ඒකක තුළ ජනනාත්මක නිදහස් සාකච්චා වලට සහභාගීවීමට හා මධ්‍යම කාරක සභාව ඇතුලු ඕනෑම පක්ෂ ව්‍යුහයක් වෙත විවේචන ඉදිරිපත් කිරීමට අයිතිය ඇත.
2. පක්ෂයේ මධ්‍යම කාරක සභාව හා මහ සමුලුව ඇතුලු ඕනෑම ඉහළ සංවිධානයකට යෝජනා, හා ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අයිතිය ඇත. එහිදී ප්‍රතික්ෂේපිත යෝජනා පිළිබඳ අදාල සාමාජිකයාට කරුණු පැහැදිළි කිරීමක් කළ යුතුය.
3. පක්ෂයේ ඕනෑම නිලයකට පත් කිරීමට ඡන්දය දීමට හා ව්‍යවස්ථානුකූලව එම නිළ වලට පත්වීමට අයිතිය ඇත.

## සාමාජිකත්වය අහෝසි කිරීම

**6 වන වගන්තිය**

පක්ෂයට පිළිගත හැකි සාධාරණ හේතුවක් නොමැතිව පහත සඳහන් අයුරින් ක්‍රියාකිරීම සාමාජිකත්වය අහොසි කිරීමට හේතුවේ.

1. තම ඒකකයේ සාමාන්‍ය රැස්වීම් වාර 3 කට නොකඩවා සහභාගී නොවීම
2. නොකඩවා සාමාජික මුදල් මාස 3 ක් නොගෙවීම.
3. පක්ෂ විනය හා මූල්‍ය විනය උල්ලංඝණය කිරීම

පෙරටුගාමී සමාජවාදී පක්ෂය
முன்னிலை சோஷலிசக் கட்சி
FRONTLINE SOCIALIST PARTY

4. පක්ෂ තීරණ හා නියෝගයන්ට පටහැනිව කටයුතු කිරීම

කිසියම් සාමාජිකයකු ඉහත කොන්දේසි එකක් හෝ කිහිපයක් මත චෝදනා ලබයි නම් ඒ පිළිබඳව අවසන් තීරණ මධ්‍යම කාරක සභාව විසින් ගනු ලැබේ.

**පක්ෂයෙන් ඉල්ලා අස්වීම**

**7 වන වගන්තිය**

පක්ෂයෙන් ඉල්ලා අස්වීමට අදහස් කරන සාමාජිකයා ඒ පිළිබඳව මධ්‍යම කාරක සභාවට ලිඛිතව දැනුම් දිය යුතුය.තීරණ ගැනීමේ අවසන් අයිතිය මධ්‍යම කාරක සභාව සතුය.

හතරවන අධිකාරිය

**මධ්‍ය මණ්ඩල**

**8 වන වගන්තිය**

- පක්ෂයේ උත්තරීත්තර බලමණ්ඩලය වූ කලී පක්ෂ සමුලුවයි.
- සාමාන්‍ය තත්ත්වය යටතේ මෙය සෑම වසර හතරකටම වරක් කැඳවිය යුතුය.
- මහ සමුලුව කැඳවනු ලබන්නේ පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසිනි.
- මහ සමුලුව පවත්වන දිනය, ස්ථානය, න්‍යාය පත්‍රය තීරණය කරනු ලබන්නේ මධ්‍යම කාරක සභාව විසිනි. එම න්‍යාය පත්‍රය දින හතකට පෙර සමස්ථ සාමාජිකයන්ට ලබාදිය යුතුය.
- සමුලුව විසින් න්‍යාය පත්‍රය අනුමත කළ යුතුය.
- සමුළුව ප්‍රකාශයට පත් කළ පසු සාමාජිකත්වය ප්‍රදානය කිරීම හා සාමාජිකත්වය අහෝසි කිරීම නතර කළ යුතුය.

**මහා සමුලුවේ කටයුතු හා බලතල**

**9 වන වගන්තිය**

- මහා සමුලුවේ සභාපති ලේකම් මණ්ඩල පත්කිරීම. න්‍යාය පත්‍රය හා ස්ථාවර අණපනත් තීරණය කිරීම.
- මධ්‍යම කාරක සභාව විසින් හා වෙනත් මධ්‍යම මණ්ඩල විසින් ඉදිරිපත් කරන වාර්ථා, යෝජනා, හා ප්‍රකාශන සාකච්ඡා කිරීම හා ඒවා ගැන තීරණ ගැනීම.
- පක්ෂ වැඩපිළිවෙල, ප්‍රතිපත්ති, ව්‍යවස්ථාව තීරණය කිරීම හා අවශ්‍ය වූ විට ඒවා සංශෝධනය කිරීම
- ඊළඟ සමුලුව තෙක් එළඹෙනා කාලය තුළ පක්ෂයේ මූලික ක්‍රියාමාර්ග හා උපක්‍රමයන් පිළිබඳව තීරණ ගැනීම
- පක්ෂ අයවැය සලකා බලා සම්මත කිරීම
- මධ්‍යම කාරක සභාව තෝරා පත්කර ගැනීම.

පෙරටුගාමී සමාජවාදී පක්ෂය
முன்னிலை சோஷலிசக் கட்சி
FRONTLINE SOCIALIST PARTY

## මධ්‍යම කාරක සභාව

### 10 වන වගන්තිය

- පක්ෂයේ සමුලු දෙකක් අතර තුර පක්ෂයේ වගකිව යුතු බල මණ්ඩලය වනුයේ මහා සමුලුවෙන් තෝරා පත්කරන ලද මධ්‍යම කාරක සභාව යි.
- මහා සමුලු දෙකක් අතර මධ්‍යම කාරක සභාව මුලු පක්ෂයම නියෝජනය කරයි.

## මධ්‍යම කාරක සභාවේ බලතල

### 11 වන වගන්තිය

- ජාතික හා ජාත්‍යන්තර කටයුතු වලදී පක්ෂය වෙනුවෙන් පෙනී සිටීමට, ජාතික හා ජාත්‍යන්තර ආණ්ඩු, දේශපාලන පක්ෂ, පුද්ගලයන් හා වෙනත් සංවිධාන සමග ගණුදෙනු කිරීමට, සාකච්චා පැවැත්වීමට, සම්මුති වලට එළඹීමට, හා සම්මුති අහෝසි කිරීමට බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවට පමණි.
- මහා සමුලු වාර දෙකක් අතර සියලුම ප්‍රතිපත්ති හා උපාය, උපක්‍රම හා වැඩපිළිවෙලවල් සමුලුව අනුමත කළ මූලික ක්‍රියාමාර්ගයන්ට අදාලව තීරණය කිරීමටත්, පක්ෂයට ඒ අනුව මග පෙන්වීමටත්, නායකත්වය දීමටත්, බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවට පමණි.
- පක්ෂයට අයත් සියලුම දේපළ, මුදල් හා සම්පත් පාලනය කිරීමටත් ඒ පිළිබඳව වගකීම් පැවරීමටත් බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවට පමණි.
- ව්‍යවස්ථා අර්ථකථනය කිරීමේදී මතුවන ගැටලුවල අවසන් තීරණය ඇත්තේ මධ්‍යම කාරක සභාව සතුවය.
- මහා සමුලුව පිළිබඳව හෝ පක්ෂ විනය කටයුතු පිළිබඳව හෝ අවසන් තීරණ දෙන මණ්ඩලය ලෙස කටයුතු කරනුයේ මධ්‍යම කාරක සභාවයි.
- සාමාජිකත්වය පිරිනැමීම, සාමාජිකත්වය අහෝසි කිරීම, කළ හැක්කේ මධ්‍යම කාරක සභාවට පමණි.
- පහත සඳහන් නම් කිරීම් හෝ ඉවත් කිරීම් සඳහා ද පත්කිරීම් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා ද බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවට පමණි.
    1. පක්ෂ මූලස්ථානයෙන් පළකරන සියලුම පුවත්පත්, සඟරා, ප්‍රකාශන හා වෙබ් අඩවි වලට කතෘ වරුන් හා ලේඛකයන් නම් කිරීම
    2. දිස්ත්‍රික් ලේකම් වරුන් හා පාක්ෂික බහු සංවිධාන ලේකම් වරුන් පත්කිරීම හා ඉවත් කිරීම.
    3. පාර්ලිමේන්තුව හා වෙනත් නියෝජිත ආයතන වල කණ්ඩායම් නායකයන් ඇතුලු නියෝජිතයන් පත්කිරීම හා ඉවත් කිරීම
    4. මැතිවරණ වලට ඉදිරිපත් වන අපේක්ෂක ලයිස්තු අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

## ලේකම් මණ්ඩලය

12 වන වගන්තිය

- පක්ෂයේ නිළ වගකීම් දරන්නන් වන්නේ ලේකම් මණඩලයේ සාමාජිකයන්ය
- මධ්‍යම කාරක සභාවේ දේශපාලන මණ්ඩලයේ තීරණ වලට අනුව ලේකම් මණ්ඩලය විසින් පක්ෂයේ එදිනෙදා වැඩ කටයුතු පවත්වාගෙන යා යුතුය.
- ලේකම් මණ්ඩලයේ ප්‍රමාණය, වගකීම් තීරණය කරනු ලබන්නේ හා ලේකම් මණ්ඩලය තෝරා පත්කරගනු ලබන්නේ මධ්‍යම කාරක සභාව මගිනි.
- ලේකම් මණ්ඩලය ප්‍රධාන ලේකම්, සංවිධායක ලේකම්, පාලක ලේකම්, අධ්‍යාපන ලේකම්, ප්‍රචාරක ලේකම්, මුදල් ලේකම්, හා මධ්‍යම කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් ලේකම් ධූර වලින් සමන්විත විය යුතුය.

## දේශපාලන මණඩලය

13 වන වගන්තිය

- පක්ෂයේ දෛනික දේශපාලන කටයුතු පවතවාගෙන යාම සඳහා මධ්‍යම කාරක සභාව විසින් අවශ්‍යතාවය අනුව මධ්‍යම කාරක සභාවේ සාමාජිකතවයෙන් හරි අඩකට අඩු සංඛ්‍යාවකින් යුත් දේශපාලන මණ්ඩලයක් පතකල හැකිය.
- දේශපාලන මණ්ඩලය මධ්‍යම කාරක සභාවේ උපදෙස් හා අනුදැනුම මත ක්‍රියාතමක විය යුතුය.

## පාක්ෂික බහු සංවිධාන

14 වන වගන්තිය

- පාක්ෂික බහු සංවිධාන වල සියලුම කටයුතු පක්ෂ ව්‍යවස්ථාවට හා පක්ෂ සමුලුවට යටත් විය යුතුය.
- පාක්ෂික බහු සංවිධාන වලද උත්තරීත්තර ආයතනය වන්නේ මහා සමුලුව මගින් පත්කළ මධ්‍යම කාරක සභාවය.
- පාක්ෂික බහු සංවිධානවලළ සංවිධාන ව්‍යුහය තීරණය කිරීම හා සියලුම පත්වීම් අදාළ සංවිධාන වලින් විමසා මධ්‍යම කමිටුව මගින් සිදු කළ යුතුය.

## පස්වන අධිකාරිය

### ව්‍යවස්ථා සංශෝධන හා අතිරේක නියමයන් පැනවීම

15 වන වගන්තිය

- අවශ්‍ය වූ විට විවිධ අතිරේක නියමයන් පැනවීමේ බලය මධ්‍යම කාරක සභාවට ඇත.
- එසේ පනවන අතිරේක නියමයන් පවත්නා ව්‍යවස්ථාව උල්ලංඝණය වන හෝ ඊට ප්‍රතිවිරුද්ධ වන නියමයන් නොවිය යුතුය.



පෙරටුගාමී සමාජවාදී පක්ෂය
முன்னிலை சோஷலிசக் கட்சி
FRONTLINE SOCIALIST PARTY

## ව්‍යවස්ථාව අර්ථකථනය කිරීම

16 වන වගන්තිය

- කිසියම් ව්‍යවස්ථාමය ගැටලුවක් පැණ නැගි අවස්ථාවක අර්ථකථනය කිරීමේ බලය හිමිවන්නේ මධ්‍යම කාරක සභාවටය.

17 වන වගන්තිය

- ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය ඇත්තේ මහා සමුලුවට පමණි.
- සමුලුවට පෙර මධ්‍යම කාරක සභාව විසින් අදාල සංශෝධන සියල්ල පක්ෂ සාමාජිකයන් වෙත ඉදිරිපත් කළ යුතුය.

පෙරටුගාමී සමාජවාදී පක්ෂය
முன்னிலை சோஷலிசக் கட்சி
FRONTLINE SOCIALIST PARTY